**මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ - 2016**

**-------------------------------------------**

මාර්ග අංශ සහායක ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2006 ජනවාරි 16 දින එළඹි අංක 4138-සීඊ දරන සංවර්ධන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.01 (ආ) (i) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2** **<u>ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

සංවර්ධන ණය ගිවිසුමට අනුව, එවකට මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කාර්යක්ෂම ජාතික මාර්ග පද්ධතියක තිරසාර බෙදාහැරීම මඟින් ප්‍රවාහන පිරිවැය අඩුකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මුල් සංවර්ධන ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය විගැහි මිලියන 69.10 (එජඩො මිලියන 100) කට සමාන රු.මිලියන 10,125 ක් වන අතර සම්පූර්ණ මුදලම මූල්‍යාණය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. තවද, විගැහි මිලියන 59.60 (එජඩො මිලියන 98.1) කට සමාන රු.මිලියන 11,579 ක අතිරේක වෙන් කිරීමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2008 ජූනි 23 දින එළඹි පළමු අතිරේක සංවර්ධන ණය ගිවිසුම යටතේ සපයා තිබුණි. තවද, 2011 මාර්තු 15 දින දෙවන අතිරේක සංවර්ධන ණය ගිවිසුම එළඹි අතර විහැගි මිලියන 63.6 (එජඩො මිලියන 100) කට සමාන රු.මිලියන 11,081 ක අතිරේක වෙන්කිරීමක් එමගින් කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2006 ජනවාරි 16 දින ආරම්භ කරන ලද අතර 2011 මාර්තු 31 වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 ජූනි 30 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ මෙහෙයුම් අඛණ්ඩව සිදුකර තිබුණු අතර 2016 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**1.3** **<u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** **<u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවධානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණන සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම

මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මවිසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන වැඩිමනත් මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැහීමට පත්වන පරිදි සැසඳීම කර තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය ආදියෙන් කරන ලද මිලදී ගැනීම් හදුනා ගත හැකි වන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුනේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(ඌ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**2.1 <u>මතය</u>**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල්, ඒවා සපයනු ලැබු කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඇ) සංවර්ධන ණය ගිවිසුම් වල දක්වා ඇති මුල්‍ය සම්මුතින්වලට අනුකූල වූ බවත්ය.

**2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.මිලියන 7.64 ක ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ විශේෂ ණය පහසුකම් යටතේ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබුණු අත්තිකාරම් මුදල ජංගම වගකීම් යටතේ දැක්වීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අරමුදල් මූලාශ්‍ර යටතේ දක්වා තිබුණි.

(ආ) ගෙවීමේ අව්‍යාජභාවය සනාථ කිරීම සඳහා පිළිගත හැකි ලිඛිත සාක්ෂියක් නොමැතිව එකතුව රු.මිලියන 4.27 ක් කොන්ත්‍රාත්කරුවකුට ගෙවීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

**3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>**

**3.1 <u>අරමුදල් උපයෝජනය</u>**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සංවර්ධන ණය ගිවිසුම අනුව මූල්‍යනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අය වැය ඇස්තමේන්තු මගින් කරන ලද වෙන් කිරීම් | උපයෝජනය වූ අරමුදල | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුලදී | | 2016 දෙසැම්බර් 31 දක්වා | |
| | ඵජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | ඵජඩො මිලියන | රු. මිලියන | ඵජඩො මිලියන | රු. මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | | | | | | | |
| ණය අංක 4138 සීඊ | 100.00 | 10,125 | - | | | 68.37 | 9,709 |
| ණය අංක 4429 සීඊ | 98.10 | 11,579 | - | | | 76.84 | 10,912 |
| ණය අංක 4906 සීඊ | 100.00 | 11,081 | - | | | 62.01 | 9,326 |
| ශ්‍රී ලංකා රජය | - | - | 48.97 | 0.33 | 48.97 | 49.33 | 7,061 |
| | **298.10** | **32,785** | **48.97** | **0.33** | **48.97** | **256.55** | **37,008** |

**3.2 <u>භෞතික ප්‍රගතිය</u>**

ලැබී තිබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් පළාත් 08 ක ජාතික මාර්ගවල කිලෝමීටර් 620 ක් සහ පළාත් සභා 03 ක සහ ප්‍රාදේශීය සභා 09 ක් යටතේ පවතින පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර් 635 ක් පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත් 2015 ජුනි 30 දිනට ජාතික මාර්ගවල කිලෝමීටර් 685 ක් සහ පළාත් සහ ග්‍රාමීය මාර්ගවල කිලෝමීටර 162 ක පුනරුත්ථාපනය කිරීමේ කටයුතු අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය මඟින් පෑලියගොඩ - පුත්තලම

මාර්ගයේ සහ කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගයේ කොටස් 04 ක පුනරුත්ථාපන කටයුතු සහ පානදුර නගරයේ ගුවන් පාලමේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දින සිට දින 56 සිට දින 359 කාල පරාසයක ප්‍රමාදයක් සහිතව 2015 ජුනි 30 දින අවසන් කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තාත්වික නොවන වැඩ විෂය පථය හේතුවෙන්, ප්‍රමාණ පත්වල රු.මිලියන 369 ක පිරිවැයකට ඇතුළත් කරන ලද අයිතම් කොළඹ, ගාල්ල හම්බන්තොට මාර්ගයේ ක්‍රොස් හන්දියේ සිට නල්ලූරුව හන්දිය දක්වා කොටස පුනරුත්ථාපනයට කරන ලද ඇස්තමේන්තුවෙන් ඉවත් කර තිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 552 ක නව අයිතමයක් හඳුන්වාදී තිබුණි. කෙසේවෙතත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.13.4 වගන්තියට පටහැනිව අතිරේක වැඩ වෙනුවෙන් විචලනතා නියෝග සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) කොළඹ - ගාල්ල - හම්බන්තොට මාර්ගයේ කොටස් පුනරුත්ථාපනයට සම්බන්ධ කොන්ත්‍රාත්කරුට කරන ලද ගෙවීම්වලින් අඩුකරන ලද රු.මිලියන 295.93 ක ප්‍රමාද ගාස්තු මුදල අවසාන බිල්පත පියවන අවස්ථාවේදී නිදහස් කර තිබුණි. කෙසේවෙතත්, ඒ පිළිබඳ හේතු විගණනය සඳහා පැහැදිළි කර නොතිබුණි. තවද, අඩුපාඩු නිවැරදි කිරීම සඳහා වගකියන කාලපරිච්ඡේදය තුළදී ඒ සඳහා අවධානය යොමු කිරීමේ කොන්ත්‍රාත්කරුගේ වගකීම සැලකිමකින් තොරව මාර්ගයේ පුනරුත්ථාපනය කළ කොටස්වල අඩුපාඩු නිවැරදි කිරීමට එකතුව රු.මිලියන 5.67 ක් අමතරව ගෙවා තිබුණි.

(ඇ) ඉදිකිරීම් කටයුතුවල සහ විදුලි සෝපාන පද්ධතියේ අඩුපාඩු හේතුවෙන් පදික මාරුව ලෙස භාවිතා කිරීම සඳහා 2016 ජුනි රු.මිලියන 186 ක පිරිවැයකට ඉදිකරන ලද පානදුර ගුවන් පාලම 2018 දෙසැම්බර් 31 දින දක්වා වසා දමා තිබුණු බව නිරීක්ෂණය විය.

## 3.4 පරිබාහිර කටයුතු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සාමකාමී බේරුම්කරණ කමිටුවේ තීරණය අනුව, කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 68 ක අමතර ගෙවීමක් කර තිබුණි. කෙසේවෙතත්, ඒ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුගේ කාර්යාලයේ මෙහෙයුම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ව්‍යාපෘතිය යටතේ මාර්ග පුනරුත්ථාපන කටයුතුවලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් මඟින් රු.මිලියන 6.52 ක පිරිවැයකට මිලදීගෙන තිබූ බව නිරීක්ෂණය විය.

## 3.5 නිශ්කාර්ය වත්කම්

ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාර දෙන ලද රු.මිලියන 13.37 ක් වටිනා පයිප්ප සහ උපාංග තොගයක් වර්ෂ 03 ක් පුරා මීගමුව ගබඩාවක නිශ්කාර්යව පැවතුණි.